# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

11

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

## 10 ශ්‍රේණිය

## ශේෂ පිරික්සුම

1. ශේෂ පිරික්සුමක් යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද?
2. ශේෂ පිරික්සුමක දළ ආකෘතියක් ඇඳ දක්වන්න.
3. "ශේෂ පිරික්සුම ගිණුමක් නොවේ. ලේඛනයකි". පැහැදිලි කරන්න.
4. ශේෂ පිරික්සුමේ හර තීරුවල එකතුව බැර තීරුවල එකතුවට සමාන වීමෙන් තහවුරුවන කරුණු 2 ක් දක්වන්න.
5. පහත ගිණුම් 2021.01.31 දිනට තුලනය කර දක්වන්න.

a) ණයගැති (අමල්)ගිණුම

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| 21.01.01 | ශේ/ඉ/ගෙ<br>විකුණුම් | | 25 000<br>20 000 | 01.10 | මුදල් | | 15 000 |

b) ණයහිමි (කමල්) ගිණුම

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| 21.01.15 | මුදල් | | 25 000 | 01.01<br>01.25 | ශේ/ඉ/ගෙ<br>ගැනුම් | | 30 000<br>20 000 |

c) බැංකු ණය ගිණුම

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| 21.01.25 | මුදල් | | 15 000 | 01.10 | ශේ/ඉ/ගෙ | | 125 000 |

d) වැටුප් ගිණුම

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| 21.01.24 | මුදල් | | 30 000 | | | | |

e) ලද වට්ටම්

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| | | | | 01.31 | විවිධ ණයහිමි | | 2 000 |

6. පහත දක්වා ඇත්තේ ලිතුමිගේ ව්‍යාපාරයේ 2021.03.31 දිනට ලෙජර් ගිණුම් තුලනය කර ලබාගත් ශේෂ ලැයිස්තුවයි. එම ශේෂයන් ඇතුළත් කර 2021.03.31 දිනට ශේෂ පිරික්සුම පිළියෙල කරන්න.

| | | | |
|---|---|---|---|
| මුදල් | 80 000 | බැංකු ණය | 150 000 |
| ගැනුම් | 200 000 | බැංකු ණයපොළී | 6 000 |
| විකුණුම් | 350 000 | ප්‍රවාහන ගාස්තු | 8 000 |
| ණයගැති | 35 000 | ගැනිලි | 4 000 |
| ණයහිමි | 40 000 | ගොඩනැගිලි | 300 000 |
| වැටුප් | 30 000 | මෝටර්රථ | 500 000 |
| රක්ෂණ ගාස්තු | 20 000 | කොමිස් ආදායම් | 7 000 |
| ගෙවල් කුලී | 15 000 | දුන් කොමිස් | 4 000 |
| ලද වට්ටම් | 5 000 | ප්‍රාග්ධනය | 702 000 |
| දුන් වට්ටම් | 2 000 | | |
| ආයෝජන | 50 000 | | |

7. පහත දැක්වෙන්නේ 2021.03.31 දිනට රිසදිගේ ව්‍යාපාරය පිළියෙල කරන ලද ශේෂ පිරික්සුමය. එහි ඉංග්‍රීසි අක්ෂරවලින් දක්වා ඇති අයිතමවල වටිනාකම් ශේෂ පිරික්සුමට පහතින් දක්වා ඇත.

රිසදිගේ ව්‍යාපාරය
2021.03.31 දිනට ශේෂ පිරික්සුම

| විස්තරය | හර | බැර |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 200 000 | |
| යන්ත්‍ර සූත්‍ර | 150 000 | |
| 2020.04.01 දිනට තොගය | 25 000 | |
| ගැනුම් | 180 000 | |
| විකුණුම් | | 320 000 |
| වැටුප් | 24 000 | |
| රක්ෂණ ගාස්තු | 4 000 | |
| A. බැංකු ණය | .............. | .............. |
| බැංකු ණයපොළී | 2 000 | |
| B. ලද වට්ටම් | .............. | .............. |
| C. ලද කොමිස් | .............. | .............. |
| D. ගෙවල් කුලී | .............. | .............. |
| ආයෝජන | 80 000 | |
| E. ආයෝජන ආදායම් | .............. | .............. |
| F. මුදල් | .............. | .............. |
| G. ණයගැතියෝ | .............. | .............. |
| H. ණයහිමියෝ | .............. | .............. |
| ප්‍රාග්ධනය | | ? |
| | | |

A – 80 000
B – 4 000
C – 6 000
D – 20 000
E – 5 000
F – 12 000
G – 30 000
H – 5 000

ඔබ විසින් ,

1. A සිට H දක්වා වූ අයිතමවල වටිනාකම් අදාළ නිවැරදි තීරුවේ සටහන් කරන්න.
2. ප්‍රාග්ධනය ගණනය කරන්න.

8. පහත දැක්වෙන්නේ සදසුගේ ව්‍යාපාරයේ 2021 මැයි මාසයේ සිදුවූ ගනුදෙනු කිහිපයකි. ඉහත ගනුදෙනු මුදල් පොතක සටහන් කිරීමෙන් අනතුරුව ලෙජරයට පිටපත් කර 21.05.31 දිනට ශේෂ පිරික්සුම පිළියෙල කරන්න.

| | |
|---|---|
| 5/1 | ප්‍රාග්ධනය ලෙස රු. 100 000 ක් යෙදවීම. |
| 5/5 | අත්පිට මුදලට ගැනුම් රු. 20 000 |
| 5/10 | අත්පිට මුදලට විකුණුම් රු. 30 000 |
| 5/15 | ඉන්වොයිසි අංක 10 යටතේ සමනලීගෙන් ණයට ගැනුම් රු. 15 000 |
| 5/20 | සමනලීට මුදල් ගෙව්වා රු. 13 000 |
| 5/23 | ඉන්වොයිසි අංක 01 යටතේ චේතිකරට ණයට විකුණුම් රු. 18 000 |
| 5/27 | සේවකයන්ට වැටුප් ගෙව්වා රු. 8 000 |
| 5/31 | චේතිකරගෙන් මුදල් ලැබුණා රු 16 000 |

9. පහත දැක්වෙන්නේ සෙනෙහස්ගේ ව්‍යාපාරයේ 2021 ජුනි මාසයේ සිදුවූ ගනුදෙනු කිහිපයකි.

| | |
|---|---|
| 6/1 | අයිතිකරු ප්‍රාග්ධනය ලෙස රු. 150 000 යෙදෙව්වා. |
| 6/5 | රු. 25 000 ක් යොදවා බැංකු ගිණුමක් ආරම්භ කළා. |
| 6/8 | චෙක්පතක් නිකුත් කර රු. 8 000ක ගැනුම් සිදු කළා |
| 6/10 | ඉන්වොයිසි අංක 08 යටතේ දිමුතුගෙන් ණයට ගැනුම් රු. 11 000 |
| 6/20 | ඉන්වොයිසි අංක 01 යටතේ හර්ෂට ණයට විකුණුම් රු. 15 000 |
| 6/23 | හර්ෂගෙන් චෙක්පතක් ලැබුණා රු. 13 000 යි. එය එම අවස්ථාවේ දීම බැංකු ගත කළා. |
| 6/25 | බැංකු ණයක් ගත්තා රු. 50 000 යි. |
| 6/28 | ව්‍යාපාරයේ කඩකුලිය චෙක්පතකින් ගෙව්වා රු. 4 000 යි. |
| 6/30 | බැංකු ණය වාරිකය ගෙව්වා රු. 2 000 යි. |

ඉහත දක්වන ලද ගනුදෙනු මූලික සටහන් පොත්වල සටහන් කිරීමෙන් අනතුරුව ලෙජර් ගිණුම්වලට පිටපත් කර 2021/06/30 දිනට ශේෂ පිරික්සුම පිළියෙල කරන්න.

10. රදිස්නගේ ව්‍යාපාරයේ 2021.07.01 දිනට පහත ගිණුම් ශේෂ දක්නට ලැබිණ.

| | |
|---|---|
| මුදල් | 80 000 |
| බැංකු | 20 000 |
| ණයගැති(සමන්) | 25 000 |
| ණයහිමි(නාමල්) | 25 000 |
| බැංකු ණය | 30 000 |
| ප්‍රාග්ධනය | 70 000 |

ඉන් අනතුරුව පහත ගනුදෙනු සිදුවිය.

| | |
|---|---|
| 7/1 | ණයගැති සමන්ගෙන් චෙක්පතක් ලැබුණා රු. 8 000 යි. දුන් වට්ටම රු. 500 යි. එම චෙක්පත එම අවස්ථාවේදීම බැංකුගත කළා. |
| 7/6 | ඉන්වොයිසි අංක 18 යටතේ නාමල්ගෙන් ණයට ගැනුම් රු. 15 000 යි. |
| 7/10 | නාමල්ට මුදලින් ගෙව්වා රු. 18 000 යි. ලද වට්ටම රු. 1000 යි. |
| 7/15 | ඉන්වොයිසි අංක 12 යටතේ සමන්ට ණයට විකුණුම් රු. 10 000 |
| 7/20 | අත්පිට මුදලට විකුණුම් රු. 18 000 යි. |
| 7/23 | අත්පිට මුදලට ගැනුම් රු. 12 000 යි. |
| 7/25 | සමන්ගෙන් රු. 20 000 ක චෙක්පතක් ලැබීමේදී දුන් වට්ටම 10% |
| 7/28 | බැංකු ණය ගෙව්වා රු. 5 000 යි. |
| 7/30 | සමන්ගෙන් ලද චෙක්පත බැංකුගත කළා. |

ඉහත ගනුදෙනු මූලික සටහන් පොත්වල ඇතුළත් කිරීමෙන් අනතුරුව ලෙජර් ගිණුම්වලට පිටපත් කර 2021/07/31 දිනට ශේෂ පිරික්සුම පිළියෙල කරන්න.



වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

11. දසිතගේ ව්‍යාපාරයේ 2021 අගෝස්තු මාසයේ සිදුවූ ගනුදෙනු පහත දැක්වේ.

8/1 ගිණුම් ශේෂ

| | | |
|---|---|---|
| මුදල් | | 80 000 |
| ණයගැති - | සංජය | 20 000 |
| | මනුර | 15 000 |
| ණයහිමි | සාරංගි | 35 000 |
| | අනුර | 25 000 |
| බැංකු ණය | | 60 000 |
| බැංකු ගිණුම | | 100 000 |
| ප්‍රාග්ධනය | | 95 000 |

මාසය තුළ පහත ගනුදෙනු සිදු විය.

| | |
|---|---|
| 8/2 | අත්පිට මුදලට විකුණුම් රු. 20 000යි. |
| 8/5 | අත්පිට මුදලට ගැනුම් රු.18 000යි. |
| 8/8 | ඉන්වොයිසි අංක 18 යටතේ සාරංගිගෙන් ණයට ගැනුම් රු. 15 000යි |
| 8/10 | සාරංගිට මුදල් ගෙව්වා රු. 25 000යි. ලද වට්ටම් රු.100 යි. |
| 8/13 | ඉන්වොයිසි අංක25 යටතේ අනුර ගෙන් ණයට ගැනුම් රු.8 000යි. |
| 8/15 | අනුරට චෙක්පතකින් මුදල් ගෙව්වා රු.24 000යි. ලද වට්ටම් රු.1 500යි. |
| 8/18 | ඉන්වොයි අංක 24 යටතේ සංජයට ණයට විකුණුම් රු.13 000යි. |
| 8/20 | සංජයගෙන් රු.23 000ක් ලැබීමේදී දුන් වට්ටම 10%යි. |
| 8/23 | ව්‍යාපාරයේ සේවකයන්ට චෙක්පතතකින් වැටුප් ගෙව්වා රු.20 000යි. |
| 8/24 | බැංකු ණය චෙක්පතකින් ගෙව්වා රු.8 000යි. |
| 8/26 | ඉන්වොයිසි අංකං 25 යටතේ මනුරට ණයට විකුණුම් රු.15 000යි |
| 8/27 | මනුරගෙන් චෙක්පතක් ලැබුණා රු. 20 000 යි. එය එම අවස්ථාවේදීම බැංකුගත කළා. |
| 8/28 | මනුරගෙන් ලැබී තැන්පත් කල චෙක්පත අගරු වූ බව බැංකුව දන්වා එව්වා. |
| 8/29 | ව්‍යාපාරයේ විදුලිබිල මුදලින් ගෙව්වා රු. 4 000 යි. |
| 8/30 | මනුරගෙන් මුදල් ලැබුණා රු. 20 000 යි. දුන් වට්ටම රු. 1 000 යි. |

ඉහත ගනුදෙනු ඇසුරෙන්,

1. මුදල් පොත
   බැංකු ගිණුම
   ගැණුම් ජර්නලය
   විකුණුම් ජර්නලය පිළියෙල කරන්න.
2. එම ගනුදෙනු ලෙජර් ගිණුම්වලට පිටපත් කර 2021/8/31 දිනට ගිණුම් තුලනය කරන්න.
3. 2021/08/31 දිනට ශේෂ පිරික්සුම පිළියෙල කරන්න.

12. නිපුනිගේ සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයේ 2021 සැප්තැම්බර් මාසයේ පළමු දිනට පහත ගිණුම් ශේෂ දක්නට ලැබිණි.

| | | |
|---|---|---|
| මුදල් | | 70 000 |
| බැංකු | | 80 000 |
| ණයගැතියෝ - | ජනක | 30 000 |
| | හෂාන් | 25 000 |
| ණය හිමියෝ - | විදුම් | 23 000 |
| | අමල්ක | 27 000 |
| ප්‍රාග්ධනය | | 155 000 |



වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

2021 සැප්තැම්බර් මාසය තුළ පහත ගනුදෙනු සිදුවිය.

ණයට ගැණුම්

| දිනය | සැපයුම්කරු | ඉ.අ. | මුළු වටිනාකම | වෙනත් තොරතුරු |
|---|---|---|---|---|
| 21/09/05 | විදුම් | 25 | 12 400 | අඩුකල වෙළෙඳ වට්ටම 10% |
| 21/09/15 | අමල්ක | 14 | 13 600 | අඩුකල වෙළෙඳ වට්ටම 5% |
| 21/09/20 | විදුම් | 26 | 14 800 | - |
| 21/09/30 | අමල්ක | 24 | 20 000 | අඩුකල වෙළෙඳ වට්ටම 20% |

ණයට විකුණුම්

| දිනය | ඉ.අ. | ගැණුම්කරු | වෙනත් තොරතුරු |
|---|---|---|---|
| 21/09/07 | 18 | ජනක | කිලෝවක් රු.95 බැගින් හාල් කිලෝ 100 |
| 21/09/12 | 19 | හෂාන් | කිලෝවක් රු.220 බැගින් පරිප්පු කිලෝ 50 |
| 21/09/18 | 20 | ජනක | කිලෝවක් රු.800 බැගින් මුංඇට කිලෝ 20 |
| 21/09/24 | 21 | හෂාන් | කිලෝවක් රු.400 බැගින් කඩල කිලෝ 25 |

ණයට විකුණුම් කිරීමේදී 10% ක වෙළෙඳ වට්ටමක් ලබාදීම ව්‍යාපාරයේ විකුණුම් ප්‍රතිපත්තිය වේ.
ලැබීම්වලට අදාළ තොරතුරු

| දිනය | විස්තරය | මුදල් | චෙක්පත් | වෙනත් තොරතුරු |
|---|---|---|---|---|
| 21/09/05 | විකුණුම් | 20 000 | 15 000 | චෙක්පත එදිනම තැන්පත් කළා. |
| 21/09/09 | ජනක | 26 000 | | |
| 21/09/15 | හෂාන් | 26 000 | 7 000 | චෙක්පත 21/09/17 බැංකු ගත කළා. |
| 21/09/20 | ලද කොමිස් | 8 000 | | |
| 21/09/25 | බැංකු ණය | 60 000 | | |
| 21/09/30 | ජනක | | 5 000 | චෙක්පත එදිනම තැන්පත් කළා. |

ගෙවීම්වලට අදාළ තොරතුරු

| දිනය | විස්තරය | මුදල්(රු) | චෙක්පත් (රු.) |
|---|---|---|---|
| 21/09/08 | විදුම් | 12 000 | |
| 21/09/10 | විදුලිබිල | | 4 000 |
| 21/09/13 | කඩකුලී | 6 000 | |
| 21/09/16 | අමල්ක | 13 000 | |
| 21/09/18 | විදුම් | | 10 000 |
| 21/09/20 | බැංකු ණය | | 4 000 |
| 21/09/22 | විදුම් | 5 000 | |
| 21/09/30 | අමල්ක | | 20 000 |

අවශ්‍ය වන්නේ ,

01. බැංකු ගිණුම
02. ගැනුම් ජර්නලය
03. විකුණුම් ජර්නලය
04. මුදල් පොත
05. අදාල ලෙජර් ගිණුම්
06. 2021/09/30 දිනට ශේෂ පිරික්සුම